**ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - 2023**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 42 අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඵලදායී ජීව කාලය ඉක්ම වූ වත්කම් 06ක් ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව ඉකුත් වර්ෂයේ ක්ෂය කරන ලද රු.56,667 ක් සමාලෝචිත වර්ෂයේ ද ක්ෂය ලෙස දක්වා තිබුණි. | 2024 අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.1,531,479 ක් වුවත් එය රු.1,332,011 ක් ලෙස රු.199,468 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ නිවැරදි කරන ලද බව. | ස්ථාවර තැන්පතු පොලිය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනයන්හි ස්ථාවර වත්කම්වලට අදාළ සටහන් අනුව සමාලෝචිත වර්ෂය තුල ඉවත් කිරීම් ලෙස දක්වා තිබුණු රු.2,186,700 ක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා රු.1,870,300 ක ගෘහ භාණ්ඩ හා උපකරණවලට අදාළ ඉවත් කළ වත්කම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම වත්කම් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු නොවීය. | අදහස් දක්වා නොතිබුණි. | ඉවත්කල වත්කම් පිළිබඳ විස්තර පවත්වා ගත යුතුය. |
| (ඈ) | එකතුව රු.59,551,366 ක වත්කම් විෂයයන් 08 ක හා එකතුව රු.14,373,315 ක වගකීම් විෂයයන් 05 කට අදාළ ස්ථාවර වත්කම් ලේඛන, ශේෂ තහවුරු කිරීමේ ලිපි හෝ ලිපිගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | අදහස් දක්වා නොමැත. | ගිණුම් ශේෂවල තොරතුරු සම්පූර්ණ කර නිවැරදිතාවය තහවුරු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ 02 ක එකතුව රු.3,014,533 ක් වූ අතර ඉන් වසර 05 ට වැඩි රු.790,462ක් අය කර නොතිබුණි. | රු.145,340 ක ශේෂය අයකර ගැනීමේ ගැටලුවක් පවතින අතර රු.645,122 ක් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇති බව. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතුය |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ 02 ක එකතුව රු.10,032,374 ක් වූ අතර ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයට අදාළ රු.108,451ක් හා වසර 05 ට වැඩි රු.9,923,923ක් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,003,434 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 5,547,435 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,550,869 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වර්ෂයේ පුනරාවර්ථන වියදම් සියයට 9 කින් වැඩි වී තිබුණද ආදායම් සියයට 17 කින් වැඩි වී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 හා 2020 වර්ෂයේ වෘත්තීය අංශයේ පාඨමාලා ආදායම මුළු පාඨමාලා ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 33 ක් වුවද, 2021 වර්ෂයේ සිට මෙම අංශය තාවකාලිකව වසා දැමීම හේතුවෙන් උපයාගත හැකිව තිබුණු පාඨමාලා ආදායමක් අහිමි වී තිබුණි. | කළමනාකරණ මණ්ඩලයේ තීරණයක් මත 2021 වර්ෂයේ සිට එම අංශය වසා දමා ඇති බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | ආයතනයේ වෑන් රථයක් 2022 නොවැම්බර් 17 වන දින කොල්ලුපිටිය ප්‍රදේශයේ දී අනතුරකට ලක්වී තිබුණු අතර එදින ඒ සම්බන්ධව කොල්ලුපිටිය පොලිසියේ පැමිණිල්ලක් කර තිබුණ ද එම පැමිණිල්ලේ පිටපතක් ලබාගෙන නොතිබුණි. අලුත්වැඩියාවට වැයවන මුදල රු.45,000 ක් බව පෞද්ගලික ගරාජයක් මගින් ඇස්තමේන්තු කර තිබුණද විගණන දින වන | අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

විටත් අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) හා 104 (4) ප්‍රකාරව පරීක්ෂණ සිදු කර අලාභයට වගකිවයුත්තන්ගෙන් හෝ අදාළ රක්ෂණ ආයතනයෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2023 සැප්තැම්බර් 20 දින වන විටත් වැන් රථයට සිදු වූ හානිය අලුත්වැඩියා කරගෙනද නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 ජූලි 31 දිනැති කළමනාකරණ මණ්ඩල තීරණය අනුව, අභ්‍යන්තර කථිකාචාර්යවරයෙක් මසකට අවම පැය 60 ක් දේශන පැවැත්විය යුතු වුවද ප්‍රමාණවත් පාඨමාලා ප්‍රමාණයක් සැලසුම් කර නොපැවැත්වීම හේතුවෙන් කථිකාචාර්යවරුන් 09 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජූනි දක්වා කාලය තුල මසකට පැය 60 ට වඩා අඩුවෙන් දේශන සඳහා යොදවා තිබුණු අතර කථිකාචාර්යවරු තිදෙනෙකු මාස 03 කදී එක් දේශනයකට හෝ යොදවා නොතිබුණි. තවද කථිකාචාර්යවරු 03 දෙනෙකුගේ මාස 02 ක හා කථිකාචාර්යවරු 04 දෙනෙකුගේ එක් මාසයක දේශන පැවැත්වීමේ පැය ගණන් විගණනයට ඉදිරිපත් නොවුණි. | අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් මත දේශන පැය ප්‍රමාණය පැය 40 ක් හා විෂය සමගාමී ක්‍රියා පැය 20ක් ලෙස දැනට තීරණය කර ඇති බවත් ඉදිරියට, අදාළ ක්ෂේත්‍රයන්හි පාඨමාලා සම්බන්ධිකරණය කොට ඒවායේ අධ්‍යයන කටයුතුවලට මැදිහත්වී මෙම අඩුපාඩුව නිරාකරණය කරගන්නා ලෙසට උපදෙස් ලබාදී ඇති බව. | කාර්යය මණ්ඩලය ඵලදායීව ඉහළ කාර්යක්ෂමතාවය කින් සේවයේ යොදවා ගත යුතුය. |
| (ආ) | කාමර 120 කින් යුත් නේවාසිකාගාර 09 ක උපයෝජනය සම්බන්ධයෙන් පරීක්ෂාවේදී මුල් මාස 06 තුල කාමර භාවිතයට ගත හැකි දින ගණනට සාපේක්ෂව සියයට 4 සිට සියයට 20 ක පරාසයක උපයෝජනයක් පමණක් සිදුව තිබීම හේතුවෙන් නේවාසිකාගාර 09 හි කාමර ඌණ උපයෝජිතව පැවතුණි. ඒ තුල පැවති කාමර 38 කින් සමන්විත නේවාසිකාගාර 02 ක් අප්‍රේල් මාසය තුල භාවිතා කර නොමැති අතර කාමර 06 කින් සමන්විත නේවාසිකාගාර 02 ක් ජනවාරි මාසය තුල එක් දිනක් පමණක් උපයෝජනය කර තිබුණි. | ඉන්ධන අර්බුදය හා විදුලි කප්පාදුව හේතුවෙන් හා රටතුල පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් පුහුණු කටයුතු මාර්ගගත ක්‍රමය යටතේ පැවැත්වීමත් බාහිර ආයතන වැඩසටහන් පැවැත්වීම අඩුවීමත් වුවද 2023 ජූලි මාසයේ සිට උපයෝජන මට්ටම ඉහල අගයක් ගෙන ඇති බව. | ඌන උපයෝජිත වත්කම් ප්‍රයෝජනයට ගෙන ආදායම් උපයාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බහු කාර්ය ගොඩනැගිල්ලේ බිම් මහලෙහි වර්ග අඩි 3564 කින් සමන්විත කොටසක් උපයෝජනයකින් තොරව වසා දමා තිබුණු අතර එහි පැවති වෘත්තීය අංශයේ පාඨමාලාද තාවකාලිකව වසා දැමීම හේතුවෙන් එම අංශයද ආදායම් ඉපැයුම් කටයුත්තකට යොදා නොගැනුණි. තවද පැරණි කාර්යාල ගොඩනැගිල්ලෙහි A13 හා A12 යන කාමර ඌන උපයෝජිත බව නිරීක්ෂණය විය. | බහුකාර්ය ගොඩනැගිල්ලේ පරිශ්‍රයන් උපයෝජනය කර ගැනීමට ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර තිබුණ ද ඒ සඳහා අමාත්‍යාංශයේ අනුමැතියක් නොලැබුණු බවද, A 13 හා A 12 කාමර මාර්ගගත ක්‍රමයට දේශන පැවැත්වීමට යොදා ගන්නා බව. | වත්කම් නිසිපරිදි උපයෝජනය කළ යුතුය. |